රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 02/94 (iii)

මගේ අංකය: 11/719 ඊ 302/115
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
1995 ජූලි මස 11 වන දින.

සියළුම ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්.,

## ප්‍රායෝගික පුහුණුව ලබාගැනීමට අනුයුක්ත පුහුණුවන්නන්

1995.02.07 දින නිකුත් කරන ලද අංක: 02/94 (ii) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමතරවයි.

රාජ්‍ය ආයතනවල ප්‍රායෝගික පුහුණුව සඳහා අනුයුක්ත කරන පුහුණුවන්නන් පිලිබඳ පහත දක්වෙන ක්‍රියා මාර්ගය ක්‍රියාත්මක කරවන ලෙස සියලුම ආයතන ප්‍රධානීන්ට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

1. වෙනත් විශේෂ අවසරයක් ලබා නොමැත්තේ නම් සෑම ප්‍රායෝගික පුහුණුවක්ම මාස 6 කට සීමා කලයුතුය.

2. පුහුණුවීම් සඳහා දෙනු ලබන දීමනාවට අමතරව වෙනත් කිසිදු දීමනාවක් හෝ පාරිශ්‍රමිකයක් නොගෙවිය යුතුය.

3. පුහුණු ආයතන මගින් ඉදිරියේදී ප්‍රායෝගික පුහුණුව සඳහා එවනු ලබන කණ්ඩායම්වලට ඉඩ සැලසිය යුතු නිසා මාස 6 ක පුහුණුව අවසන්වීමත් සමගම ඔවුන්ගේ පුහුණුව ප්‍රතිපත්තියක් ලෙස අත්හිටුවිය යුතුය.

4. නොයෙකුත් අහිතකර පූර්වාදර්ශ ඇති වන බැවින් දීමනා නොලබන පදනම මත හෝ වෙනයම් අන්දමකට නිර්දේශිත 6 මාසික පුහුණුවීම් කාලසීමාව ඉක්මවා පුහුණුවීම්වලට ඉඩ නොදිය යුතුය.

5. පුහුණු ආයතනවල ලිපිකරු පාඨමාලා පවත්වනු ලබන්නේ පුද්ගලික අංශය සඳහා වන පුහුණු ශ්‍රමය අරමුණු කර ගෙන බැවින් එවැනි පිරිස් ප්‍රායෝගික පුහුණුව සඳහා පුද්ගලික අංශය වෙත යොමු කලයුතු වේ. රාජ්‍ය අංශයේ ලිපිකරු කටයුතු හා පුද්ගලික අංශයේ ලිපිකරු කටයුතුවල විශාල වෙනස්කම් ඇති බැවින් ලිපිකරු පුහුණුවන්නන් සඳහා රාජ්‍ය ආයතනවල පුහුණුව දීමෙන් පලක් නොවේ. එහෙයින් රජයේ ආයතන විසින් ලිපිකරු පුහුණුව සඳහා පුහුණුවන්නන්ට ඉඩ නොසැලසිය යුතුය.

6. යතුරු ලේඛණය, ලසුලේඛණය සහ පරිගණක දත්ත සටහන් විෂයයන් සඳහා වන පුහුණුව රජයේ හා පුද්ගලික අංශයේ සමාන තත්ත්වයක් ඇති හෙයින් එවැනි අයට ඉහත දක්වූ පරිදි මාස 6 ක් උපරිමයකට යටත්ව පුහුණුව සඳහා ඉඩදීම පිළිබඳව විරුද්ධත්වයක් නැත. එහෙත් ඒ සඳහා පුහුණුවන්නන්ට ඉඩ සැලසීමෙන් රාජ්‍ය ආයතනවල කටයුතුවලට කිසිදු බාධාවක් ඇති නොවිය යුතුය.

7. මාස 6 කට වැඩි ප්‍රායෝගික පුහුණු කාලයක් අවශ්‍ය පුහුණු පාඨමාලා ඇති ආයතන ලෙස දැනට ආයතන අධ්‍යක්ෂ විසින් හඳුනා ගෙන ඇත්තේ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය හා එයට සම්බන්ධ කටුනායක පිහිටි තාක්ෂණඥයන් පුහුණු කිරීමේ ආයතනය , මොරටුව ගාලුපාරේ පිහිටි ආධුනික පුහුණු කිරීමේ ආයතනය සහ ශ්‍රී ලංකා මෝටර් යාන්ත්‍රික ඉංජිනේරු ආයතනය යන ආයතනයන් ය. එම ආයතනවල තාක්ෂණික ක්ෂෙත්‍රයේ තෝරාගත් පාඨමාලා වල නිර්දේශිත ප්‍රායෝගික කාලසීමාව හෝ තුන් වසරක උපරිමය යන දෙකින් අඩු කාලයකට යටත්ව පුහුණුව ලබාදීමට මා විසින් හෝ මා වෙනුවෙන් ආයතන අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද සහතිකයක් මත ඉඩදිය හැකිය.

8. පුහුණුවන්නන් පුහුණුව සඳහා ආයතනයකට අනුයුක්ත කරන විටදී ඔවුනට ආයතනයේ කිසියම් තනතුරක වගකීම් නොපැවරිය යුතු වන අතර, පුහුණුව පමණක් ලබාදිය යුතුය.

9. යම් පුහුණුවකට අදාල රැකියා අවස්ථා රාජ්‍ය ආයතනයක පමණක් පවතින අවස්ථාවකදී පුහුණුවන්නන් තාක්ෂණික පුහුණුව සඳහා එබඳු රාජ්‍ය ආයතනවලට අනුයුක්ත නොකල යුතුය . මන්ද යත් පුහුණුවෙන් පසු තමන්ට වෙනත් ආයතනයක රැකියාවක් ලබා ගැනීමට නොහැකි හෙයින් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට පරිබාහිරව සේවයට ඍජුවම අන්තර්ග්‍රහණය කරන ලෙස විවිධ ඉල්ලීම් ඉදිරිපත් විය හැකි බැවිනි.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය